සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

**ඉන්දීය ඉතිහාසය II (II කොටස)**
இந்திய வரலாறு II (பகுதி II)
History of India II (Part II)

**25 A S II**

**ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා**

**උපදෙස්:**

* පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
* **II කොටස A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
* **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ඉන්දියාවේ දළ සිතියමක් I කොටස** සමඟ සපයා ඇත.)

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) තක්ෂිලා (ii) රාවි
(iii) චන්හුදාරෝ (iv) ථානේෂ්වර්
(v) බරණැස (vi) ගුජරාට්
(vii) තප්ති (viii) අයිහෝලේ
(ix) හිමාලය කඳුවැටිය (x) කොරමැන්ඩල් වෙරළ
(xi) සාංචි (xii) ගංගා

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි.)

## B කොටස

**2.** (i) හරප්පා සහ මොහෙන්ජොදාරෝ නටබුන් සොයා ගත් ඉන්දියානු පුරාවිද්‍යාඥයින් **දෙදෙනා** නම් කරන්න. (ලකුණු 02යි.)

(ii) හරප්පා සහ මොහෙන්ජොදාරෝ නගරවල කැණීම් කළ බ්‍රිතාන්‍ය පුරාවිද්‍යාඥයින් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02යි.)

(iii) (a) මහා ධාන්‍යාගාරයේ නටබුන් හමුවූ නගරය නම් කරන්න. (ලකුණු 01යි.)

(b) ඉන්දු නිම්න වැසියන්ගේ ප්‍රධාන වරාය නම් කරන්න. (ලකුණු 01යි.)

(iv) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ නගර නිර්මාණය සහ ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 10යි.)

**3.** ඍග් වෛදික යුගයේ පැවති දේශපාලන, සමාජ සහ ආගමික තත්ත්වයන් පශ්චාත් වෛදික යුගයේ දී වෙනස් වී ඇති ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 16යි.)

**4.** "අසෝක රජු මෞර්ය අධිරාජ්‍යයේ සිටි ශ්‍රේෂ්ඨතම පාලකයා විය." මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න. (ලකුණු 16යි.)

**5.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) මෙගස්තිනිස්
(ii) ක්‍රි.පූ. 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ දේශපාලන තත්ත්වය
(iii) නන්ද රාජවංශය
(iv) අර්ථශාස්ත්‍රය

(ලකුණු 08 × 2 = 16 යි)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!
පිටුව බලන්න.

## C කොටස

6. අලහබාද් ප්‍රශස්තිය ඇසුරෙන් සමුද්‍රගුප්ත රජුගේ කාර්ය සාඵල්‍යය පරීක්ෂා කරන්න. (ලකුණු 16යි.)

7. (i) හර්ෂවර්ධන රජුගේ රාජධානියේ අගනුවර නම් කරන්න. (ලකුණු 01යි.)
(ii) 'හර්ෂචරිත' නමැති කෘතියේ කතුවරයා නම් කරන්න. (ලකුණු 01යි.)
(iii) හර්ෂවර්ධන රජු විසින් රචනා කරන ලද ග්‍රන්ථ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02යි.)
(iv) හර්ෂවර්ධන රජුගේ දේශපාලන, සංස්කෘතික හා ආගමික කාර්ය සංසිද්ධීන් සාකච්ඡා කරන්න. (ලකුණු 12යි.)

8. පහත දැක්වෙන ශීර්ෂ යටතේ චෝළ බලය ව්‍යාප්ත වූ ආකාරය පිළිබඳ විස්තර කරන්න.
(i) දකුණු ඉන්දියාවේ චෝළ බල ව්‍යාප්තිය
(ii) ඉන්දියාවෙන් පිටත චෝළ බල ව්‍යාප්තිය
(ලකුණු 16යි.)

9. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.
(i) කුෂාණ රාජවංශය
(ii) ගෞතමීපුත්‍ර සාතකර්ණි
(iii) දෙවන චන්ද්‍රගුප්ත යටතේ ගුප්ත අධිරාජ්‍යයේ ව්‍යාප්තිය
(iv) පල්ලව කලා හා ගෘහනිර්මාණ ශිල්පය (ලකුණු 08 × 2 = 16යි.)

* * *

WWW.PastPapers.WiKi

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!